**ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයයන් 6 ක ට අදාළව විචලතාවය සියයට 12 ක අඩුවීමේ සිට සියයට 213 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබුණි. | වැය විෂයන්හි මූලික වැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා පහත දක්වා ඇති හේතු පාදක විය.<br>• රාජකාරී ඉටුකිරීමට පත් කිරීම මත දීමනා ගෙවීම, සංග්‍රහ පිරිවැය ඉහළ යාම, ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2023 අනුව ප්‍රාග්ධන වියදම් සීමා කිරීම,<br>• 2022 ඇනවුම් කල පරිගණක යන්ත්‍ර වලට අදාළව 2023 දී බිල්පත් නිරවුල් කිරීම,<br>• මූල්‍ය කල්බදු වාහන සඳහා වාරික ගෙවීමට ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපාදන අයවැය දෙපාර්තමේන්තුව මඟින් සීමා කිරීම,<br>• ඩොලරයේ අගය අසීමාන්තිකව ඉහළ යාම,<br>• 2022 වසරට අදාළ ගෙවීම් සම්බන්ධව සහතික කරන ලද තොරතුරු ඇතුලත් වියදම් වාර්තාව ජපාන රජය විසින් යම් ප්‍රමාදයක් සහිතව ලබාදී ඇති අතර, එම වියදම් ද ඇතුළුව 2023 වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සලසා ගත යුතු වීම. | මු.රෙ.50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිවත්, තාර්කික ලෙසත් පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මූලධන වැය විෂයයන් දෙකක් සඳහා වෙන් කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කාලපරිච්ඡේදය තුළ වැය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | මේ සඳහා පහත සඳහන් කරුණු හේතු වී ඇත.<br>• ජාතික අයවැය චක්‍රලේඛ අනුව වියදම් සීමා කිරීම.<br>• දෙපාර්තමේන්තුවේ සර්වර් පද්ධතියේ ඇතැම් කොටස් ඉදිරි වසර තුනකට පෙර ජීවකාලය අවසන් වන බැවින් එහි මව් සමාගම විසින් එම කාර්ය | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතික්ෂේප කරන බව දන්වන අතර එබැවින්, මෙම උත්ශ්‍රේණිගත කිරීම සිදු නොකර ඉදිරි වර්ෂය සඳහා ද සේවා ගිවිසුම් ගතවීමක් පමණක් සිදු කිරීම.<br><br>• ශ්‍රී ලංකා රජය විසින් ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමට එකඟ වී ඇති අතර ඒ අනුව නව ණය කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ද පවතී. එබැවින්, CS-DRMS (Debt Recording and Management System) පද්ධතිය උත්ශ්‍රේණිගත කිරීම සිදු නොකිරීම.<br><br>• TA System මෘදුකාංගය නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණද, ආසියානු සංවර්ධන බැංකුව මඟින් ඒ සඳහා අරමුදල් ප්‍රදානයක් ලබාගැනීමට සාකච්ඡා වූ බැවින්, මෙම ප්‍රතිපාදන ඒ සඳහා අවශ්‍ය නොවීය.<br><br>• ජනාධිපති කාර්යාලය විසින් ඉලෙක්ට්‍රොනික අත්සන් සකස් කිරීමට සැලසුම් කළ නමුත්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවා ඇති Lankapay ආයතනය විසින් ප්‍රමුඛතා ලේඛනයක් අනුව ඩිජිටල් අත්සන් යෙදුම් (Digital Signature Application) ලබාදීම සිදු කරන බැවින්, ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත මෙතෙක් අවස්ථාව හිමිව නොතිබීම. | |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සහ මූලධන වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.145,528,430 ක ඉතිරියක් පැවති අතර, එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 99 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | ප්‍රතිපාදන ඉතිරිවීම් වලට හේතු පහත පරිදි වේ.<br>• නිලධාරීන් 13 දෙනෙකු පමණ දේශීය විදේශීය දීර්ඝ නිවාඩු ලැබීම.<br><br>• අයවැය චක්‍රලේඛ 09/2022, 01/2023 හා 02/2023 අනුව වියදම් පාලනය කිරීම හේතුවෙන්, ඉන්ධන පරිභෝජනය සීමා කිරීම, ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සිදු නොකිරීම, ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ මිලදී නොගැනීම හා දේශීය පුහුණු සීමා කිරීම. | -එම- |

- ජනාධිපති කාර්යාලය නිකුත් කරන ලද උපදෙස් ප්‍රකාරව විදේශීය ගමන් වියදම් සඳහා ගෙවනු ලබන අනියම් හා සංයුක්ත දීමනා අඩු කිරීම.

- ලිපිද්‍රව්‍ය වල මිල ගණන් සැලකිය යුතු මට්ටමකින් පහළ යාම සහ වාහන නඩත්තු වාර්තා නොවීම.

- වර්ෂයේ අවසන් මාස නවය සඳහා වන Video Conferencing (Zoom) බලපත්‍ර, ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදුන් ප්‍රදානයක් මඟින් ලබාගැනීම.

- 2022 අගෝස්තු මස සිට අමාත්‍යාංශය අන්තර්ජාල පහසුකම් අත්හිටුවීම.

- මාර්ගගත ක්‍රමය මඟින් අදාල ලිපි යැවීමට කටයුතු කිරීම.

- ඇතැම් විදේශ නියෝජිත ආයතන මඟින් රජයේ සම්මාදම් දායක මුදල් ගෙවීම සඳහා ඉල්ලුම් කර නොතිබීම.

- දේපල ණය ලබාගත් නිලධාරීන් ස්ථාන මාරු වී යාම මත ණය වාරික වල රජයේ දායකත්වය සඳහා වෙන්කල ප්‍රතිපාදන ඉතිරි වීම.

- අදාල විදේශ නියෝජිත ආයතන මඟින් බිල්පත් නිරවුල් කිරීම සඳහා ඉදිරිපත් නොකිරීම.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුව දැනට භාවිතා කරන CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය, ණය සේවාකරණ පුරෝකථන ඇතුළු කාර්යයන් සඳහා හඳුන්වා දී ඇති පද්ධතියකි. ඒ අනුව ණය | නව ණය කළමනාකරණ දත්ත පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. | යාවත්කාලීන කළ ගිණුම්කරණ හා මුදල් ප්‍රවාහ පහසුකම් සහිත පද්ධතියක් පවත්වා ගත යුතු වීම. |

කළමනාකරණ කටයුතු සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගණුදෙනු ගිණුම්ගත කිරීමේ පහසුකම් සහිත හා/හෝ CS-DRMS පද්ධතියෙන් ITMIS පද්ධතියට අවශ්‍ය දත්ත හුවමාරු කළ හැකි පහසුකම් සහිත වූ ණය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත් වී තිබුණි.

(ආ) 2023 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි විය.

| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව ප්‍රදාන ඇතුලත්ව **2023** (එ.ජ.ඩො. මිලියන) | සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රදාන ඇතුලත්ව **2023** (එ.ජ.ඩො. මිලියන) | විචලනය (එ.ජ.ඩො. මිලියන) | විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස (සියයට ) |
|---|---|---|---|---|
| ලෝක බැංකුව | 806 | 753.2 | (52.8) | (7) |
| ආසියානු සංවර්ධන බැංකුව | 1,011 | 856.9 | (154.1) | (15) |
| චීනය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) | 21 | 24.2 | 3.2 | 15 |
| ජපානය | 31 | 39.6 | 8.6 | 28 |
| කොරියාව | 10 | 0 | (10) | (100) |
| මැදපෙරදිග රටවල් | 47 | 28.9 | (18.1) | (38) |
| දකුණු ආසියානු රටවල් | 90 | 142.5 | 52.5 | 58 |
| රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 30 | 32.2 | 2.2 | 7 |
| IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 15 | 9.7 | (5.3) | (35) |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 682 | 681.5 | (0.5) | 0.07 |
| **එකතුව** | **2,743** | **2,568.7** | **(174.3)** | |

2022 අප්‍රේල් 12 වැනි දින නිකුත් කරන ලද විදේශ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය පිළිබඳ නිවේදනය සමඟ බොහෝ ණය දෙන රටවල් හා ආයතන විසින් දැනට ක්‍රියාත්මක කරමින් තිබූ ව්‍යාපෘති සඳහා අරමුදල් ප්‍රතිලබ්ධි කිරීම අත්හිටුවන ලද අතර, මේ වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාවට යෝජනා කරන ලද වැඩසටහනට අනුගත වෙමින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා එම ණය දෙන රටවල් හා ආයතන සමඟ පැවැත් වේ. එම සාකච්ඡාවල ප්‍රගතිය සලකා බලා 2023 අවසන් කාර්තුවේ යම් ප්‍රතිලබ්ධීන් ප්‍රමාණයක් සිදුවනු ඇතැයි අපේක්ෂාවෙන් 2023 වසර සඳහා කොරියාව, ජපානය, චීනය ඇතුළු ද්විපාර්ශ්වික ණය දෙන රටවල් සඳහා ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු කරන ලදි. නමුත් එම සාකච්ඡාවන් අපේක්ෂා කළ පරිදි අවසන් නොවීම හේතුවෙන් මැදපෙරදිග හා කොරියාව යන රටවල් ඇස්තමේන්තු කළ ප්‍රතිලබ්ධිවලට වඩා සත්‍ය ප්‍රතිලබ්ධි අඩු වීමක් සිදු වී ඇත.

ජපානය මගින් මූල්‍යයනය කරනු ලබන ව්‍යාපෘතිද, 2023 වසර අවසන් වන විටද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡාවල අවසන්

විධිමත් පරිදි සැලසුම් සහගතව විදේශ ණය මූල්‍යනයක් සිදු කළ යුතු වීම.

ඊට අදාළව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2023 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,743 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,568.7 ක් වීම හේතුවෙන් සත්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො. මිලියන 174.3 කින් එනම්, සියයට 6 කින් පමණ අඩු වී තිබුණි.

(ii) දකුණු ආසියානු රටවල්, ජපානය, චීනය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සහ රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් යන රටවල් වලින් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙළින් සියයට 58, 28, 15 සහ 7 කින් වැඩි වී තිබුණි.

(iii) ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, මැදපෙරදිග රටවල් හා IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කළ ණය පිළිවෙළින් සියයට 7, 15, 38 සහ 35 කින් අඩු වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී කොරියාවෙන් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ද, වර්ෂය අවසාන වන විටත් ණය ලබාගෙන නොතිබුණි.

එකඟතාවයකට එළඹීමට නොහැකි වූ බැවින් ණය ප්‍රතිලබ්ධි වීම් සිදු නොවිණි. එනමුත් ජපානය විසින් ශ්‍රී ලංකාව වෙත ප්‍රදාන මුදල් අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි වශයෙන් ලබා දී ඇති බැවින් එහි සත්‍ය ප්‍රතිලබ්ධි වැඩි වීමක් සිදු වී ඇත.

රටතුල පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වයත් සමග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව මගින් සිදුකළ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු අගයෙන් සත්‍ය ප්‍රතිලබ්ධීන් සුළු වශයෙන් වෙනස් වීමට හේතු වී ඇත.

(ඇ) විදේශීය රාජ්‍ය ණය වාර්තා කිරීමට භාවිතා කරන CS-DRMS ණය කළමනාකරණ පරිගණක පද්ධතියේ අන්තර්ගත දත්ත නොසැසඳීම්

(i). CSDRMS 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශන සන්සන්දනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශ ණය එකතුව මුළු වටිනාකම රු.මිලියන 15,823 ක් විය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් (Explanatory Notes) 24(II) අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණයවල මුළු වටිනාකම රු.මිලියන 17,103.2 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම පෙර වර්ෂවලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය

මෙම ණය අංකවලට අදාළ CS-DRMS 854-1 වාර්තාවේ 2023.12.31 දිනට අවසන් ශේෂ ණයහිමියන්ගේ වාර්තා හා සැසඳේ.

රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ii) | ණය අංක 2018003 අදාළව CSDRMS 854-1 වාර්තාව අනුව 2023 වර්ෂයට අදාළව කිසිදු ප්‍රතිලබ්ධිවීමක් නොමැති වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව EUR 727,053 ක් ප්‍රතිලබ්ධි වී ඇති බව දක්වා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ණය මුදලට අදාළව 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී 2023 වර්ෂය තුළ ගිණුම් ගත කරන ලද ණය වටිනාකම EUR 335,930 ක් පමණක් විය. ඒ අනුව මෙම ණයමුදලට අදාළව 2023 වර්ෂය තුළ ප්‍රතිලබ්ධි වීම් අතර EUR 391,123 ක වෙනසක් නිරීක්ෂණය විය. | ණයහිමියා සමඟ ශේෂයන් සැසඳීමේදී අනාවරණය වූ පරිදි ප්‍රමාද වී 2023.07.18 දින ලද 2021 වර්ෂයට අදාළව සිදුවූ යූරෝ 391,122.75 ක ප්‍රතිලබ්ධියක් 2023 වර්ෂයේදී සටහන්කර ඇත. 2023.12.31 දිනට අවසන් ශේෂ වටිනාකම් අදාළ ණයහිමියාගේ වාර්තා හා සසැඳේ. ඒ අනුව, 854-1 හි සටහන් නිවැරදිය. | -එම- |
| (iii) | ණය ගිවිසුම් 23 ක ට අදාළව CSDRMS 854-1 වාර්තාවේ 2022 දෙසැම්බර් 31 දිනට වූ ශේෂයන්, 2023 ජනවාරි 01 දිනට අදාළ ශේෂයන් සමඟ සැසඳීමේදී එකතුව රු.මිලියන 30,401 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(11) න් සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 න් සමාලෝචිත වර්ෂය තුළදී සත්‍ය වශයෙන්ම ණය ප්‍රතිලබ්ධිවීම්වල නිවැරදි වටිනාකම නිරූපණය නොවන බව ද නිරීක්ෂණය විය. | පහත සඳහන් කරුණු හේතු වී තිබුණි.<br>• විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත අදාළ ණයහිමියන් වෙතින් ප්‍රමාද වී ලද ප්‍රතිලබ්ධි වටිනාකම් සහ වෙනස්කරන ලද ප්‍රතිලබ්ධි වටිනාකම් අනුව, CS - DRMS දත්ත පද්ධතිය නිවැරදිව යාවත්කාලීන කර ඇත.<br>• 2010117, 2010121 - එ.ජ.ඩො. (USD) විනිමයෙන් ලබාගත් මෙම ණය, 2010 වර්ෂයේදී එ.ජ.ඩො. විනිමයෙන් විශේෂ ගැනුම් හිමිකම් (SDR) විනිමයට පරිවර්තනය කර ඇත. 2010 පරිවර්තනය සිදුවන විට විශේෂ ගැනුම් හිමිකම් (SDR) විනිමයෙන් පැවති ශේෂය, එ.ජ.ඩො. (USD) විනිමය මඟින් 2022 | රාජ්‍ය ණය ගැනීම , ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම හා ප්‍රතිලබ්ධි ප්‍රමාද වීම් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

වර්ෂයේදී ගෙවා අවසන් කළද, විනිමය වෙනස හේතුවෙන් මෙම ණයෙහි නොගෙවූ ශේෂයක් පෙන්නුම් කරනු ලැබීය. මෙම තාක්ෂණික දෝෂය CS-DRMS දත්ත පද්ධතියේ නිවැරදි කිරීම හේතුවෙන් විගණනයෙන් පෙන්වාදුන් වෙනස ඇතිවී තිබුණි.

- ප්‍රංශ ෆ්‍රෑන්ක් විනිමයෙන් ලබාගත් ණය, 2002 වර්ෂයේදී එම ණය ප්‍රංශ ෆ්‍රෑන්ක් විනිමයෙන් යූරෝ විනිමයට පරිවර්තනය කරන විට පැවති ශේෂය, යූරෝ මඟින් 2019 වර්ෂයේදී ගෙවා අවසන් කිරීමේදී ඇතිවූ විනිමය වෙනස නිවැරදි කිරීම.

- අදාළ ණයහිමියා වන ආසියානු සංවර්ධන බැංකුව සමඟ සිදුකරන ලද සන්සන්දනය කිරීමේදී අනාවරණය වූ පරිදි ප්‍රතිලබ්ධි ආපසු පවරා ගැනීම් වටිනාකම් දත්ත පද්ධතියෙන් ඉවත් කර ණයහිමියාගේ ප්‍රතිලබ්ධි සටහන් හා ගලපා 2023.05.09 දින නිවැරදි කිරීම.

- අදාළ ණයහිමියා සමඟ සිදුකරන ලද සන්සන්දනය කිරීමේදී අනාවරණය වූ පරිදි මෙම ණය අංකවලට අදාළව සිදුවූ ප්‍රතිලබ්ධි වටිනාකමක් අනුව CS-DRMS දත්ත පද්ධතිය නිවැරදිව යාවත්කාලීන කර ඇත.

| | | | |
|---|---|---|---|
| | | • මෙම ණය Science & Technology Human Resource Development ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද 2019.01.17 දින ගිවිසුම්ගත වූ ණය මුදල් දෙකකි. මෙම ණය මුදල් දෙකෙහි ගනුදෙනු සටහන් කිරීමේදී අදාළ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදී ඇති අංක SRI 3699, SRI 3698 වලට අදාළ සටහන් අතපසුවීමකින් මාරුවී දත්ත පද්ධතියේ සටහන් කර ඇති බව ණයහිමියා සමඟ සිදුකරන ලද සන්සන්දනය කිරීමේදී (Reconcile) නිරීක්ෂණය විය. මෙය නිවැරදි කිරීම හේතුවෙන් මෙම ණය ශේෂ වෙනස විය.<br><br>ඉහත ණය අංකවලට අදාළ යාවත්කාලීන කිරීම් පිළිබඳව 2023 වර්ෂයේදී අවශ්‍ය කටයුතු සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව දැනුවත්කර ඇති අතර, ප්‍රතිලබ්ධි ප්‍රමාදවී ලැබීම් අවම කරගැනීමට ගන්නා ක්‍රියාමාර්ග විගණනයට යොමුකර ඇත. | |
| (iv) | ණය ගිවිසුම් 04 ක් සම්බන්ධයෙන් එකතුව රු.821,115,454 ක සෘන ණය ප්‍රතිලබ්ධි වීම් සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සහ CSDRMS 854 -1 වාර්තාවෙන් නිරීක්ෂණය විය. | අදාළ ණයහිමියා විසින් පවත්වාගෙන යනු ලබන මාර්ගගත පද්ධතියේ ප්‍රතිලබ්ධි ආපසු පවරාගැනීම් (Refund) සටහන්ව තිබූ අතර, එය සෘණ අගයයක් ලෙස CS-DRMS දත්ත පද්ධතියේ නිවැරදිව සටහන් කර ඇත. | රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (v) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(I) න් ඉදිරිපත් කර ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ව්‍යාපෘති ණය ශේෂවලට (Foreign Currency Banking Unit Loan (Project) Balances) අදාළ CS-DRMS 854-1 වාර්තාව සමඟ පරීක්ෂා කිරීමේදී 2017045 දරන ණය ගිවිසුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට CS-DRMS 854-1 වාර්තාවෙහි සහ 2023 ජනවාරි 01 දිනට එම වාර්තාවේ USD 227,823 ක් හෙවත් රු.82,724,927 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ණය ආපසු ගෙවීම් අතර ද USD 227,823 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එහි දේශීය මුදල් වටිනාකමෙහි කිසිදු වෙනසක් නිරීක්ෂණය නොවීය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවන ලද USD 332,704 ක මුදල දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී USD 1 ක් රු.524.6050 ක් ලෙස අසාමාන්‍ය විදේශ විනිමය අනුපාතයක් යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය. | විවිධ විනිමයෙන් සේවාකරණය (Multicurrency) වන මෙම 2017045 ණය අංකයට අදාළව 2022.12.30 දිනට ණය ආපසු ගෙවීමක් අත්වැරදීමකින් ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුව ණය ලබාගත් එ.ජ.ඩො. විනිමය වලංගු කිරීම පද්ධති සැකැස්ම තුළ සිදුකර නොමැත. එය නිවැරදි කිරීම හේතුවෙන් මෙම වෙනස ඇති වී තිබේ. අදාළ විනිමය අනුපාතික නිවැරදිව සටහන් කර ඇත. | -එම- |
| (vi) | ප්‍රදායකයන් විසින් එවා තිබූ ණය ශේෂ තහවුරුකිරීම්, රජයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සහ පරිගණකගත ණය කළමනාකරණ පද්ධතියේ 854-1 වාර්තාව සමඟ සංසන්දනය කිරීමේදී ණය වර්ග 13කට අදාළව වූ ශේෂය රු.මිලියන 4,775 ක් වැඩියෙන්ද ණය වර්ග 14කට අදාළව රු.මිලියන 5,126 ක් අඩුවෙන්ද රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා වී ඇති බව නිරීක්ෂණය විය. | **ණය ශේෂ වැඩියෙන් සටහන් වීම.**<br>• 1990009 - අදාළ එක් එක් විනිමයෙන් ලද ප්‍රතිලබ්ධි විශේෂ ගැනුම් හිමිකම් විනිමයට පරිවර්තනය කිරීමේදී පද්ධතියේ ඇතිවූ විනිමය වෙනස හේතුවෙන් ඇතිවූවකි.<br>• 1998037 - Study and Expert Fund II ව්‍යාපෘති ණය මුදලෙහි ඉතිරි මුදල වූ Euro 22,583.76 ක්, මෙම ණය මුදලට අදාළව 2020.12.30 දින ණය ආපසු ගෙවීමෙන් හිලව්කිරීමය.<br>• අනෙකුත් ණය අංක 11 ට අදාළව, 2023.12.31 දිනට ගෙවීමට තිබූ ශේෂය ලෙස, 2022 අප්‍රේල් 13 සිට නොගෙවූ වාරික (Principal Arrears) ණයහිමියා විසින් | -එම- |

අඩුකර ඇත. 854-1 වාර්තාවේ ශේෂයන්ගේ ද පෙන්නුම් කරනුයේ නොගෙවූ වාරික ඇතුළත් ණය ශේෂය වේ. ඒ අනුව, 854-1 වාර්තාවේ අගයයන් නිවැරදිය.

**ණය ශේෂ අඩුවෙන් සටහන් වීම**

- ණය අංක 9කට අදාළ ණයහිමි ආයතනය වන ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ණය ආපසු ගෙවීම් නිවේදනය නිකුත් කළ දිනයේ පැවති එ.ජ.ඩොලර් හා විශේෂ ගැනුම් හිමිකම් විදේශ විනිමය හුවමාරු අනුපාතිකය හා ආපසු ගෙවීම ණයහිමියා වෙත සත්‍ය වශයෙන් ලද දිනයේ පැවති අදාළ විදේශ විනිමය හුවමාරු අනුපාතික, උච්චාවචනය හේතුවෙන් මෙම වෙනස ඇතිවී ඇත.

- විවිධ විනිමයෙන් සේවාකරණය (Multicurrency) වන 1990003 ණය අංකයේ 2023.12.01 දින සිදුවූ ණය ආපසු ගෙවීමකට එ.ජ.ඩො. 1,012,534.60 ට අදාළව අදාළ ණයහිමියා විසින් එවනු ලැබූ අනුරූපී විශේෂ ගැනුම් හිමිකම් විනිමය ප්‍රමාණය (SDR equivalent) SDR 770,000 ක ප්‍රමාණය SDR 7,700,000 ක් ලෙස අත්වැරදීමකින් දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති අතර, 2024.5.22 දින මෙය නිවැරදිකර ඇත.

- 2012022, 2018047 - මේ පිළිබඳව අදාළ ණයහිමියන්

| | | | |
|---|---|---|---|
| | | වෙතින් විමසා ඇත. එහෙත් මේ වන තෙක් මෙම ප්‍රතිලබ්ධිය ලැබීම පිළිබඳව අදාළ ණයහිමියා විසින් අප වෙත තහවුරු කර නොමැත. අදාළ ණයහිමියන් වෙතින් මෙම ප්‍රතිලබ්ධිය පිළිබඳ ලද වහාම පද්ධතිය නිවැරදි කරනු ඇත.<br><br>• 2012024, 2019019 - අදාළ ණයහිමියන් වෙතින් ප්‍රමාද වී ලද ප්‍රතිලබ්ධි වටිනාකම් සටහන් කිරීමෙන් දත්ත පද්ධතිය නිවැරදිව යාවත්කාලීන කිරීම වේ. | |
| (vii) | ප්‍රතිලබ්ධි වූ කාලපරිච්ඡේදය සලකා බැලීමේදී 2023 වර්ෂයට අදාළව ප්‍රතිලබ්ධි වූ ඇතැම් විදේශ ණය 2023 මැයි 07 දින මුද්‍රණය කළ පරිගණක ගත ණය කළමනාකරණ පද්ධතියේ 814-1 වාර්තාවේ ඇතුළත් වුවද 2024 පෙබරවාරි 17 දින මුද්‍රණය කළ වාර්තාවේ එම ප්‍රතිලබ්ධි වීම් ඇතුළත් වී නොමැති අතර, ඒ අනුව, රු.මිලියන 1,290 ක විදේශ ණය ශේෂයක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලබ්ධි වූ ණය ලෙස ගිණුම්ගත කිරීම අත්හැරී තිබුණු බව නිරීක්ෂණය විය. | • අංක 2019019 හා 2012024 - ණයහිමියන් වන ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව හා ඔපෙක් අරමුදල විසින් ප්‍රමාද වී යොමුකළ ප්‍රතිලබ්ධි වටිනාකම් සටහන් කිරීමෙන් CS-DRMS දත්ත පද්ධතිය 2024 වර්ෂයේදී නිවැරදිව යාවත්කාලීන කර ඇත. | -එම- |
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කළ යුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2023 වර්ෂය තුළ එසේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 11 ක් සඳහා එකතුව රු.මිලියන 22,210 ක විදේශ ප්‍රදාන සෘජුව ලැබී තිබුණු අතර එම වටිනාකම් ප්‍රතිපාදන සලසාගෙන රජයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත්ව ලබාගන්නා ප්‍රදාන පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ පරිදි සටහන් කිරීම සිදුකරනු ලබයි. විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වෙනත් ආයතන වෙත පමණක් වාර්තා වූ ප්‍රදාන සම්බන්ධයෙන් එම චක්‍රලේඛ, උපදෙස් මාලාවන් හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානින්ගේ වගකීමක් වේ. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | මේ සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තුව විසින් ප්‍රදාන සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට හා/හෝ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ පරිදි අක්මුදල් නිදහස් කිරීමට පෙර අදාළ ප්‍රදාන සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගෙන තිබේදැයි පරීක්ෂා කර එවැනි නිර්දේශ සහිත ප්‍රදාන සඳහා පමණක් ප්‍රතිපාදන සැලසීම හෝ අක් මුදල් නිදහස් කිරීම සුදුසු බව නිරීක්ෂණය වේ. තවද, ප්‍රදාන පිළිබඳ දැනට කෙටුම්පත් කරගෙන යනු ලබන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි නීතිමය ප්‍රතිපාදන සකසා ගැනීම සුදුසු බව ද යෝජනා කෙරේ. | |
| (ඉ) | 2019 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ආයතන 13 ක් සමග එකතු වටිනාකම් ජපන් යෙන් 984,000, යුරෝ 134,810,000, ඇමෙරිකානු ඩොලර් 58,417,841 කොරියන් වොන් 400,000, චීන යුවාන් 2,000,000,000 හා රු.4,545,750 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹියද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම විදේශ ප්‍රදාන ලද බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවිනි. | ගිවිසුම්වලට එළඹී නමුත්, විදේශ ප්‍රදාන නොලද ගිවිසුම් වලින් සමහරක් මේවන විට උපයෝජනය වී ඇති අතර, ඒවා වාර්තාගත කිරීම සඳහා ප්‍රදානය ලබාදුන් රට/ආයතනය විසින් අදාළ තොරතුරු මෙම දෙපාර්තමේන්තුව වෙත ලබා දී නොමැති ප්‍රදාන වේ. තවද,<br><br>• 2022209 හා 2023209- ජපානය, ජපාන ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ මෙම ආධාර ප්‍රදානයන් දෙක ලබා ගැනීම සඳහා ජපාන රජය සමග ගිවිසුම්ගත වී ඇත. මෙම උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ප්‍රසම්පාදන නියෝජිතයා විසින් සිදුකරමින් පවතින අතර, (1) ව්‍යාපෘතියේ උපකරණ කොටසක් මෙම වසරේද, ඉතිරිය ලබන වසරේද ලැබීමට නියමිතය. | ශ්‍රී ලංකා රජය විසින් ගිවිසුම්වලට එළඹෙන විදේශ ප්‍රදානයන් සම්පූර්ණ වශයෙන් ලබාගෙන, උපරිම වශයෙන් අරමුණට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

(3) ව්‍යාපෘතිය යටතේ වන උපකරණ ඉදිරි වසර දෙක තුල ලැබීමට නියමිතය.

- 2023207- ජපානය ,මෙය ජපන් රජය විසින් මානව සංවර්ධන ශිෂ්‍යත්ව (JDS) ජපන් ආධාර වැඩ සටහන යටතේ, ශ්‍රී ලංකාව සඳහා දිගුකාලීන ශිෂ්‍යත්ව ලබා දීමකි. එහි මුල් අදියර මෙම වසරේ ආරම්භ කර ඇති අතර, දැනට ශිෂ්‍යත්වය සඳහා නිලධාරීන් තෝරා අවසන්ව ඇති අතර, ඔවුන් 2024 අගෝස්තු මාසයේ ජපානයේ විශ්ව විද්‍යාල අධ්‍යයනය සඳහා යාමට නියමිතය.

- 2019241 - නෙදර්ලන්තය, මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්වලට එළඹීම 2019 වර්ෂයේ දී සිදු කරනු ලැබුව ද ඉන් පසුව පැන නැඟුණු තත්ත්වයන් හේතුවෙන් 2021 වර්ෂයේ ජූලි මස තෙක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද විය. එය 2025 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

- 20190211- ජර්මනිය, මෙය මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ජර්මන් රජය ලබා දෙන ලද ආධාර මුදලකි. එම ව්‍යාපෘතිය විවිධ හේතූන් මත ඉදිකිරීමේ කාලය දිගු කිරීමට සිදු වූ ව්‍යාපෘතියකි.

- ජර්මනිය, යුරෝපා සංගමය, යුරෝපා ප්‍රජාව, ඇමරිකා එක්සත් ජනපදය යටතේ වන ප්‍රදානයන් සඳහා මුදල් අමාත්‍යාංශයේ ERD/AE/GEN/16 සහ

2020.10.02 දිනැති "Streamlining the Fund Channeling Mechanism and Implementation Modalities of Grant Funded Projects" චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලැබූ උපදෙස් මාලාව පරිදි අධීක්ෂණය සහ වාර්තා පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අමාත්‍යාංශය හෝ ආයතනය ඉටුකළ යුතු කාර්යයකි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වියදම් වාර්තා නොලැබීම මත විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය තුළ උපයෝජනය කරන ලද ප්‍රමාණය ඇතුළත්ව නොමැත.

- 2021212 - ආසියානු සංවර්ධන බැංකුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රමාදයන් නිසා උපයෝජනය වී නොමැත.

- 2021211- IFAD, මෙම ප්‍රදාන අරමුදලින් සිදුකිරීමට තිබූ කාර්යයන් (තාක්ෂණ අධ්‍යයනය) ව්‍යාපෘති කළමනාකරන ඒකකය මගින් සිදුකර ඇති බැවින් මෙම මුදල වියදම් කිරීමට අවශ්‍යතාවක් නොතිබුණි.

- 20190206 - යුනෙස්කෝ, මෙම තොරතුරු මෙම දෙපාර්තමේන්තුවට වාර්තා වී නැත.

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ප්‍රකාරව, කොම්ප්ට්‍රොලර් ජනරාවරයා වෙත ඉදිරිපත් කරන ලද වත්කම් වාර්තාවෙහි, 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය ප්‍රකාරව එකතුව රු.18,800,000 ක් වූ වාහන තුනකට අදාළ තොරතුරු ඇතුළත් වී නොතිබුණි. | 2023.12.31 දිනට කොම්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත යොමු කරන වත්කම් වාර්තා අදාළ පරිගණක මෘදුකාංග වැඩසටහන ඔස්සේ ඉදිරිපත් කරන අතර, එහි වාහන පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේදී අදාල වාහනය භාවිතා කරනු ලබන ආයතනය විසින් අදාළ දත්ත ඇතුළත් කල යුතු බැවින්, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විශේෂ රාජකාරී සඳහා එහි භාවිතයට තාවකාලිකව ලබාදී ඇති මෙම වාහන පිළිබඳ 2023.12.31 දිනට අදාළ තොරතුරු මෙම දෙපාර්තමේන්තුව මඟින් ඇතුළත් නොකරන ලදි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිවැරදිව හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 18 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර, සුදුසු නිලධාරීන් මෙතෙක් අනුයුක්ත කර නොමැත. ද්වීතියික මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු 06ක් ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු අතරින්, ඒකාබද්ධ සේවයේ රියදුරු පුරප්පාඩු 04ක් හා කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු 01ක් සම්පූර්ණ කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. ප්‍රාථමික මට්ටමේ දෙපාර්තමේන්තුගත රියදුරු තනතුරු 01ක් යටපත් කිරීම සඳහා කරන ලද ඉල්ලීම රේඛීය අමාත්‍යාංශය මඟින් නිර්දේශ නොකරන ලදි. | අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හා අත්‍යවශ්‍ය නොවන කාර්ය මණ්ඩලයක් අනුමත කාර්ය මණ්ඩලය තුළ වේ නම් අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කළ යුතු වීම. |